# කළමණාකරණ ගිණුම්කරණය

## හැඳින්වීම

දේශක: අනුරාද් අනවරත්න

PASSWAY.LK

# හැඳින්වීම හා විකාශනය

තරඟකාරී ව්‍යාපාරික පරිසරයක ලාභදායී හා තිරසාර වීමට, ආයතනවලට විශ්වසනීය තොරතුරු පද්ධති අත්‍යවශ්‍යය. ගිණුම්කරණය යනු තොරතුරු හඳුනාගැනීම, මැනීම හා සන්නිවේදනය කිරීමෙන් තීරණ ගැනීමට සහාය වන ක්‍රියාවලියකි. මූල්‍ය ගිණුම්කරණය බාහිර පාර්ශවකරුවන්ට තොරතුරු ලබා දීමේදී, කළමනාකරණ ගිණුම්කරණය අභ්‍යන්තර තීරණ ගැනීම සහ කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම මූලික අරමුණ කරගනී.

නවීන කළමනාකරණ ගණකාධිකාරීවරුන් පිරිවැය පාලනයට පමණක් නොව, තත්‍ය-කාලීන දත්ත මත පදනම් වූ උපායමාර්ගික තීරණ ගෙන ආයතනවල වටිනාකම සහ තරඟකාරී වාසිය වැඩි දියුණු කිරීමට දායක වේ.



# ගිණුම්කරණය හැඳින්වීම

## ව්‍යාපාර ආයතනයක ඇල්මැති පාර්ශව සඳහා ව්‍යාපාරික තීරණ ගැනීම සඳහා අවශ්‍ය ආර්ථික තොරතුරු සම්පාදනය කිරීමේ සමස්ථ ක්‍රියාවලියයි

### මූල්‍ය ගිණුම්කරණය

ආයතනයක ආර්ථික තොරතුරු හඳුනා ගැනීම, වාර්තා කිරීම සහ බාහිර පාර්ශ්වකරුවන්ට උදාහරණ ලෙස ආයෝජකයින්, ණය දෙන අය, සහ රජයේ ආයතන සන්නිවේදනය කිරීමේ ක්‍රියාවලියක් වේ.

මෙහි අරමුණ වන්නේ ආයතනයේ මූල්‍ය තත්ත්වය, කාර්ය සාධනය සහ ලාභදායීතාව පිළිබඳ පැහැදිලි හා විශ්වසනීය තොරතුරු ලබා දීමයි.

### කළමණාකරන ගිණුම්කරණය

ආයතනය තුළ සිටින පුද්ගලයින්ට වඩා හොඳ තීරණ ගැනීමට සහ පවතින මෙහෙයුම්වල කාර්යක්ෂමතාව හා ඵලදායීතාව වැඩි දියුණු කිරීමට උපකාර කිරීම සඳහා තොරතුරු සැපයීමයි.

— *කාලින් ඩ්‍රැරි*



# කළමනාකරණ ගිණුම්කරණයේ සංවර්ධන යුග තුනක්



**1. සාම්ප්‍රදායික යුගය (1980ට පෙර):**

අභ්‍යන්තර පාලනය සහ මූල්‍ය වාර්තාකරණයට සහාය වීම ප්‍රධාන අරමුණ විය. පිරිවැය ගණනය සරල පදනම් මත (සෘජු ශ්‍රමය, යන්ත්‍ර පැය) සිදු විය. නියමිත පිරිවැය හා විචලතා විශ්ලේෂණය මත පදනම් වූ පිරිවැය පාලනයේ අවධානයක් තිබුණි.

**2. සංක්‍රාන්ති යුගය (1980–2000):**

ගෝලීයකරණය සහ තරඟකාරීත්වය වැඩි වීමත් සමඟ ක්‍රියාකාරකම්-පදනම් පිරිවැය ගණනය (ABC) සහ සමතුලිත ලකුණු පත්‍රකාව (Balanced Scorecard) ආරම්භ විය. මෙහිදී මූල්‍ය විශ්ලේෂණයට අමතරව පාරිභෝගික හා ක්‍රියාකාරී පදනම් සූචිකාවන් යොදා ගන්නා ලදි.

**3. නව/උපායමාර්ගික යුගය (2000 සිට වර්තමානය):**

කළමනාකරණ ගණකාධිකාරීවරයෝ තීරණ ගැනීමේ හවුල්කරුවන් බවට පත් වී, තත්‍ය කාලීන දත්ත, පූර්වකාල්පිත විශ්ලේෂණ සහ තිරසාරත්ව ප්‍රමිති භාවිතා කරයි. අවධානය අතීත වාර්තා වලින් ඉදිරි අනාගත ප්‍රතිඵල හැඩගැස්වීම වෙත මාරු වී ඇත.





| අංශය | මූල්‍ය ගිණුම්කරණය (Financial Accounting) | කළමනාකරණ ගිණුම්කරණය (Management Accounting) |
|---|---|---|
| ප්‍රේක්ෂකයෝ | බාහිර පාර්ශ්වකරුවන් – ආයෝජකයින්, ණය දෙන අය, රජයේ නියාමක අධිකාරීන්, මහජනතාව. | අභ්‍යන්තර පාර්ශ්වකරුවන් – කළමනාකාරීත්වය, නිෂ්පාදන මැදහත්, දෙපාර්තමේන්තු ප්‍රධානීන්. |
| දත්ත ස්වභාවය | ප්‍රධාන වශයෙන් මූල්‍ය දත්ත භාවිතා කරයි (අංක, මුදල්, ලාභ). | මූල්‍ය හා අමූල්‍ය දත්ත දෙකම භාවිතා කරයි (විකුණුම් ප්‍රමාණ, නිෂ්පාදන කාලය, සේවා තත්ත්වය ආදිය). |
| වාර්තාකරණ වාර ගණන | සාමාන්‍යයෙන් වාර්ෂික හෝ අර්ධ-වාර්ෂික වශයෙන් වාර්තා නිකුත් කරයි. | නිතර නිකුත් වේ (දිනපතා, සතියපතා හෝ මාසිකව). කාලෝචිත තීරණ ගැනීමට අවශ්‍ය වේගවත් වාර්තා ලබා දෙයි. |
| ආචාර ධර්ම මානය | නීතිමය රාමු තුළ පවතින නිශ්චිත වාර්තාකරණ ක්‍රමවේදයකට යටත්ව පවත්වා ගනී. | වෘත්තීය විනිශ්චය මත පදනම් වූ නම්‍යශීලී ක්‍රමවේදයකි. යථාර්ථභාවය, විශ්වාසනීයත්වය සහ අවංකභාවය අත්‍යවශ්‍ය වේ. |
| අරමුණ | බාහිර පාර්ශ්වකරුවන්ට — ආයෝජකයින්, ණය දෙන අය, රජයේ ආයතන — ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ කාර්ය සාධනය පෙන්වීම. | අභ්‍යන්තර කළමනාකරුවන්ට තීරණ ගැනීම, සැලසුම් කිරීම, පාලනය කිරීම සහ කාර්යක්ෂමතාව වැඩි කිරීම සඳහා තොරතුරු සපයීම. |

| අංශය | මූල්‍ය ගිණුම්කරණය (Financial Accounting) | කළමනාකරණ ගිණුම්කරණය (Management Accounting) |
| --- | --- | --- |
| කාල මානය | අතීත තොරතුරු මත පදනම් වේ. කලින් සිදුවීම් වාර්තා කරමින් මූල්‍ය ප්‍රකාශන සකස් කරයි. | අතීත දත්ත හා අනාගත ඇස්තමේන්තු දෙකම භාවිතා කරයි. ඉදිරි සැලසුම් හා තීරණ ගැනීම සඳහා උපකාරී වේ. |
| නිමැවුම් සහ වාර්තා | මූල්‍ය ප්‍රකාශන: ආදායම් ප්‍රකාශය, මූල්‍ය තත්ත්ව ප්‍රකාශය, මුදල් ගැලපීම් ප්‍රකාශය. | අභ්‍යන්තර වාර්තා: පිරිවැය විශ්ලේෂණ, අයවැය, Forecasts, Performance Reports. |
| අවධානය සහ විෂය පථය | ආයතනය සම්පූර්ණ වශයෙන් ආවරණය කරයි. ආදායම්, වියදම්, ලාභ, හා වගකීම් වැනි මුළු ව්‍යාපාරයේ මූල්‍ය තත්ත්වය පෙන්වයි. | අභ්‍යන්තර කොටස් මත අවධානය යොමු කරයි — නිෂ්පාදන, සේවා, දෙපාර්තමේන්තු, ක්‍රියාකාරකම්, පාරිභෝගිකයින් ආදී විෂයයන්ට විශේෂ අවධානයක් දක්වයි. |
| නීතිමය අවශ්‍යතාවය | නීතිය අනුව සීමිත සමාගම් සඳහා අනිවාර්ය වේ. ආයතනවල මූල්‍ය ප්‍රකාශන සකස් කර නියාමක අධිකාරීන්ට හා ආයෝජකයින්ට ඉදිරිපත් කළ යුතුය. | අනිවාර්ය නොවේ. කළමනාකාරීත්ව අවශ්‍යතාවය අනුව පමණක් පවත්වා ගනී. ප්‍රතිලාභ (Benefits) පිරිවැය (Costs) ඉක්මවා යන විට පමණක් එය නිෂ්පාදනය වේ. |



# කළමනාකරණ ගණකාධිකාරියෙකුගේ ප්‍රධාන අරමුණ

කළමනාකරණ ගණකාධිකාරියෙකුගේ ප්‍රධාන අරමුණ වූයේ කළමනාකරුවන්ට දැනුවත් තීරණ ගැනීමට උපකාර කිරීමයි. ඔවුන් සැලසුම්, පාලන සහ කාර්ය සාධන ඇගයීම් සඳහා අදාළ හා කාලෝචිත තොරතුරු සපයති. මෙය සම්පත් ඥානවන්තව භාවිතා කර, නිවැරදි නිෂ්පාදන හා සේවා මිශ්‍රණ තෝරා ගැනීමට, හා ලාභදායී ක්‍රියාකාරකම් හඳුනා ගැනීමට උපකාරී වේ.






සිහින වෙනුවට ඔබගේ ජීවිතයේ තබා ගත යුත්තේ අරමුණුයි....

**කළමනාකරණ ගණකාධිකාරියෙකුගේ මූලික සාම්ප්‍රදායික භූමිකාවන් තුනක් මෙසේ වේ:**

**1. පිරිවැය විශ්ලේෂකයා:**

**පිරිවැය එකතු කිරීම, විචලතා විශ්ලේෂණය කිරීම සහ ඉන්වෙන්ටරි තක්සේරු කිරීම මෙහි අරමුණ වේ. එය නිෂ්පාදන පිරිවැය නිවැරදිව ගණනය කර පිරිවැය පාලනයට සහාය වෙයි.**

**2. අයවැය නිලධාරියා:**

**අයවැය සකස් කිරීම සහ එයට සාපේක්ෂව කාර්ය සාධනය පරීක්ෂා කිරීම මෙහි මූලික කාර්යයයි. මෙය මූල්‍ය පාලනය සහ සම්පත් සවිධාන කිරීම සක්‍රීය කරයි.**

**3. කාර්ය සාධන නිරීක්ෂකයා:**

**පාලන ක්‍රියාවලියට අනුව ඉලක්ක හා ප්‍රමිති සැකසීම, සහ කළමනාකරුවන්ට වාර්තා මඟින් ප්‍රතිපෝෂණ තොරතුරු ලබාදීම මෙහි අරමුණයි. මෙය කාර්ය සාධනය ඇගයීමට සහ තීරණ ගැනීමට උපකාරී වේ.**



## නැගී එන කළමණාකරන ගණකධිකාරී භූමිකාවන්.

- වෙළඳාමේ ගෝලීයකරණය
- වෙළඳපල නියාමන ලිහිල් කිරීම
- කෙටි නිශ්පාදන ජීවන චක්‍ර
- අභිරුචිකරණය කල නිශ්පාදන සඳහා වැඩි ඉල්ලුමක්
- තාක්ෂණික කඩාකප්පල්කාරීත්වය
- තිරසාරත්ව අත්‍යවශ්‍යතා

## නියාමනය කරන ලද ව්‍යාපාරික පරිසරය

කළමනාකරණ ගණකාධිකාරීවරුන් අද ව්‍යාපාරික තීරණ ගැනීමට ප්‍රධාන භූමිකාවක් ඉටු කරති. නියාමන, තාක්ෂණික වර්ධන, අභිරුචිකරණ නිෂ්පාදන ඉල්ලුම සහ තරසාරත්ව අවශ්‍යතා වැනි පාරිසරික බලපෑම් ඔවුන්ගේ භූමිකාව වෙනස් කර ඇත. ඔවුන් ව්‍යාපාර උපාය මාර්ග සැලසුම් කිරීම, දෙපාර්තමේන්තු සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම, සහ විවිධ පාර්ශ්වකරුවන්ට පැහැදිලි තොරතුරු ලබා දීම සඳහා තාක්ෂණය භාවිතා කරති. නවීන කළමනාකරණ ගණකාධිකාරීවරුන්ට, තොරතුරු සරලව සහ ප්‍රයෝජනවත් ලෙස ලබා දීම වැදගත් වේ.

**1. නියාමන සහ නීතිමය බලපෑම්:** නීති සහ ප්‍රමිති වඩාත් සංකීර්ණ වී ඇති අතර, කළමනාකරණ ගණකාධිකාරීවරුන්ට සෘජුවම බලපාන IFRS, SLFRS සහ තිරසාරත්ව ප්‍රමිතීන් යාවත්කාලීනව ක්‍රියාත්මක වේ. ඔවුන්ට අනුකූලතාව තීරණ ගැනීමේ උපකරණයක් බවට පත් කළ හැකි අතර, වාර්තාකරණය සඳහා රැස් කරන තොරතුරු ව්‍යාපාරික තීරණ සඳහා භාවිතා කළ යුතුය.

**2. ආර්ථික සහ වෙළඳපල බලපෑම්:** වටිනාකම් නිර්මාණය ස්පර්ශනීය හා අස්පර්ශනීය සම්පත් (සන්නාම ශක්තිය, පාරිභෝගික සබඳතා, ඩිජිටල් වත්කම්) මගින් වෙනස් වේ. කළමනාකරණ ගණකාධිකාරීවරුන්ට මෙම වටිනාකම් තීරණ ගැනීමේදී සලකා බැලීමට අවශ්‍ය වේ.

**3. තාක්ෂණික බලපෑම්:** ERP, POS සහ මෘදුකාංග භාවිතය මගින් දත්ත රැස් කිරීම, විශ්ලේෂණය කිරීම සහ වාර්තා කිරීම පහසු වී ඇත. නව තාක්ෂණය කළමනාකරණ ගණකාධිකාරීවරුන්ට දත්ත-උපකරණ සහ ක්‍රියාකාරී තීක්ෂණ බුද්ධියක් ලබා දී, ව්‍යාපාරික තීරණ වැඩි දියුණු කිරීමට සහ ව්‍යාපාරය සඳහා උපාය මාර්ගික උපදේශකයෙකු වීමට හැකියාව සපයයි.

**4. සමාජීය සහ පාරිසරික බලපෑම්:** ESG (පාරිසරික, සමාජීය, පාලන) මිනුම් වාර්තාකරණයට ඒකාබද්ධ කිරීමෙන්, කළමනාකරණ ගණකාධිකාරීවරුන් ආයතනයට සහ සමාජයට වටිනාකමක් ලබා දිය හැකි වේ. පාරිසරික පිරිවැය, ජීවන චක්‍ර තක්සේරුව වැනි නව කුසලතා ඉදිරි-දැක්ම සහ තීරණ ගැනීම සඳහා වැදගත් වේ.

**5. වෘත්තීය විකාශන ප්‍රතිචාරය:** කළමනාකරණ ගණකාධිකාරීවරුන් සාම්ප්‍රදායික වාර්තාකරණ හැකියාවන් පමණක් නොව, දත්ත සාක්ෂරතාවය, පුළුල් පාර්ශ්වකරුවන්ගේ අවශ්‍යතා, තීක්ෂණ බුද්ධිය සහ උපාය මාර්ගික උපදේශක භූමිකාව සමඟ ඒකාබද්ධව ක්‍රියා කළ යුතුය. මෙය ඔවුන්ට ආයතනවලට දිගුකාලීන වටිනාකමක් නිර්මාණය කිරීමට, ආයතන සහ සමාජය අතර විශ්වාසය පවත්වා ගැනීමට සහ නව තාක්ෂණ හා විශ්ලේෂණ මෙවලම් උපරිමයෙන් භාවිතා කිරීමට උපකාරී වේ.

# නවීන කළමනාකරණ ගණකාධිකාරීවරුන්ගේ භූමිකාව

- ව්‍යාපාරික උපාය මාර්ග සැලසුම් කිරීමේදී විශාල බලපෑමක් ඇත.
- ඔවුන් ආයතනික තීරණ මධ්‍යස්ථානයේ සිට, අයවැය, කාර්ය සාධන සහ ගණුම්කරණ ක්‍රියාවලිය සමඟ සම්බන්ධ වේ.
- වෘත්තීය යුතුකම සහ ආචාර ධර්මය තීරණ හා වාර්තාකරණයේ විශ්වාසනීයතාව රැක ගැනීමට අවශ්‍ය වේ.
- තාක්ෂණික සහ තිරසාරත්ව අවශ්‍යතා, පාර්ශ්වකරුවන්ගේ ඉල්ලීම්, සහ වර්ධනය වන නීතිමය සීමා අතර සම්බන්ධතාවයක් කළමනාකරණ ගණකාධිකාරීවරුන් පවත්වා යාමට අවශ්‍ය වේ.
- උසස් තාක්ෂණ සහ විශ්ලේෂණ මෙවලම් භාවිතයෙන්, ඔවුන් ආයතනයට විශ්වාසනීය, ප්‍රයෝජනවත් තොරතුරු සපයන අතර දිගුකාලීන වටිනාකමක් නිර්මාණය කරයි.






## සාම්ප්‍රදායික ආචාර ධර්ම අභියෝග

- කාර්ය සාධන මැනීම: වාර්තා හැසිරවීමේ පීඩනයට එරෙහිව, සැබෑ කාර්ය සාධනය වාර්තා කළ යුතුය.

- සම්පත් වෙන් කිරීමේ පක්ෂග්‍රාහීත්වය: පරණ ආයෝජන හේතුකොට අනාගත තීරණ නොකර, ආර්ථික කුසලතාව මත පදනම් විය යුතුය.

- පිරිවැය ගණනය පද්ධති ව්‍යුහය: නිෂ්පාදන පිරිවැය නිවැරදිව සපයන, වාර්තාකරණය සහ තීරණ ගැනීම සඳහා විශ්වාසනීය පද්ධතියක් භාවිතා කළ යුතුය.

## වෘත්තීය ප්‍රමිති සහ ආචාරධර්ම තීරණ රාමුව

කළමනාකරණ ගණකාධිකාරීවරයා ආචාරධර්ම අභියෝග වලට මුහුණදී, පැහැදිලි හා ව්‍යුහගත ක්‍රියාවලියකින් ක්‍රියා කළ යුතුය. එය වෘත්තීය ප්‍රමිති මත පදනම්ව ආයතනයේ අරමුණු සහ වෘත්තීය යහපතට සහාය වන තීරණ ගැනීමට මග පෙන්වයි.

## මූලික ආචාර ධර්ම මූලධර්ම

- ❑ අවංකභාවය: සියලු වෘත්තීය සහ ව්‍යාපාරික සබඳතා වලදී ඍජුව සහ අවංකව සිටීම.
- ❑ වාස්තවිකත්වය: පක්ෂග්‍රාහිත්වය හා අනවශ්‍ය බලපෑම් වලින් තොරව නිසි විනිශ්චය ලබාදීම.
- ❑ වෘත්තීය නිපුණතාවය සහ නිසි සැලකිල්ල: නව දැනුම හා කුසලතා පවත්වාගෙන යාම, ප්‍රමිතීන්ට අනුකූලව කටයුතු කිරීම.
- ❑ රහස්‍යභාවය: ලබාගත් තොරතුරු රහස්ව තබා ගැනීම හා විනිවිදභාවය සමබරව පවත්වා ගැනීම.
- ❑ වෘත්තීය හැසිරීම: නීති හා රෙගුලාසි වලට අනුකූලව කටයුතු කර වෘත්තීය ගෞරවය ආරක්ෂා කිරීම.

**ආචාර ධර්ම තීරණ ගැනීමේ පියවර 5.**

1. **පාර්ශ්වකරුවන් හඳුනා ගැනීම** – තීරණයෙන් බලපෑමට ලක්වන්නෝ කවුද යන්න හඳුනාගන්න.
2. **තත්ත්වය විශ්ලේෂණය කිරීම** – ගැටලුව පුද්ගලික, පද්ධතිමය හෝ ආයතනික පීඩනයක්ද යන්න විමසන්න.
3. **ආචාර ධර්ම මූලධර්ම යෙදීම** – මූලික මූලධර්ම 5 (අවංකභාවය, වාස්තවිකත්වය, වෘත්තීය නිපුණතාවය, රහස්‍යභාවය, වෘත්තීය හැසිරීම) අනුව සිතා බලන්න.
4. **දිගුකාලීන බලපෑම සලකා බැලීම** – විශ්වාසය, කීර්තිය හා තිරසාරත්වය මත ඇති බලපෑම් පරීක්ෂා කරන්න.
5. **ඉලක්ක අනුකූලතාව සෙවීම** – පුද්ගලික හා ආයතනික අරමුණු ආචාර ධර්ම ප්‍රමිතීන් සමඟ සම්බන්ධ කර නිසි විසඳුමක් තෝරන්න.

ඉල්ලුමට එහා

සැපයුම දුන්විට

යැපෙන්නා පොර වේ
සපයන්නා කොර වේ

# Thank You.

*Get In Touch With Us*

+94 72 600 0713

+94 77 618 9221

anuradh221@gmail.com

https://passway.lk